# කුරුල්ලන්ගල ප්‍රාථමික සිතුවම් වර්ගීකරණය

ගම්පොළ විජය හිමි[1]

## පිහිටීම

කුරුල්ලන්ගල ලෙස හඳුන්වන සිතුවම් සහිත කුඩා පර්වත ශිඛරය ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රිකයේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කරඳගොල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටා තිබේ. එහි නිරපේක්ෂ පිහිටීම උතුරු අක්ෂාංශ $6^{0}$ 811' 877" ත් නැගෙනහිර දේශාංශ $81^{0}$064' 374" පෙන්වා දිය හැකි ය. ස්ථානය වෙත ගමන් කිරීම සඳහා ඇල්ල - වැල්ලවාය මාර්ගයේ සැතපුම් 13 පමණ වැල්ලවාය දෙසට ගමන්කර හමුවන හන්දියෙන් දකුණු පසට හැරී කි.මී. 04 ගොස් රක්බිත්තා කන්ද රජ මහා විහාරයට පිවිසිය යුතු වේ. එහි සිට, අලිකොටේ ඔයට සම්බන්දවෙන සිදීගිය දිය කඳුර දිගේ කි.මී. 2.7 ක් පමණ දුරක් ගොස් මීටර් 400ක් පමණ උසක් තරණය කිරීමෙන් සිතුවම් සහිත ස්ථානයට ළඟා විය හැකිය.

## සිතුවම්වල වස්තුවිෂය

සිතුවම් එකමත ඇඳීම නිසා සියලුම රූප පැහැදිලිව හඳුනාගැනීම අපහසු වන නමුත් අප අධ්‍යයනයේදී කුරුල්ලන් බවට නිසකයෙන් හඳුනාගත හැකි සිතුවම් 29ක් පමණ වාර්තා කිරීමට හැකිවිණි. කුරුල්ලන් පිළිබඳ අධ්‍යයනයන් වලදී බාහිර අංගලක්ෂණ අනුව සාමාන්‍යයෙන් ඔවුනොවුන් එකිනෙකාගෙන් වෙන් කර හඳුනාගැනීම සඳහා විශාලත්වය, හොටය, පාද, පෙඳය (වලිගය), පියාපත්, පියාඹන හැඩය, පැහැය, වෙසෙස් අඟපසඟ හා හැසිරීම් ආදිය මූලික වේ. මේවායින් ඇතැම් නිර්ණායක සිතුවම් වල ඇතුළත් කුරුලු ප්‍රභේද වර්ග කිරීමට මැනවින් භාවිතා කළ හැකි වේ. එහෙත් ඇතිවන ගැටලුව නම් සිතුවම් කරණයේදී කුරුල්ලන් විවිධ හා ඉතා සංකීර්ණ ඉරියව්වලින් නිරූපණය කර තිබීමයි. එමෙන්ම රේඛා කරණයේ දී හා වර්ණ පූර්ණයේ දී භාවිත ඇතැම් ප්‍රයෝග කුරුල්ලන්ගේ ශරීර අංග ඇතුළු විශේෂතා හුවා දැක්වීමට හෝ සිතුවම්වල අලංකරණය සඳහා භාවිත වුවේද යන්න හඳුනාගැනීම දුෂ්කර වේ. කුරුල්ලන්ගල පර්වත සිතුවම් අතර වෙනත් සත්වයන් නිරූපණය කෙරෙන රූප සටහන් දක්නට ලැබේ. එක් සිතුවමකින් යම් ප්‍රිමිටාවකු (Primate) නිරූපනය වන බව හඳුනා ගැනීම හැකිවේ. ඌගේ දෙපා හා දිග වලිගය පැහැදිලිව දක්නට ලැබෙන අතර ගමන් කරනා ඉරියව්ව එයින් නිරූපණය වේ. මෙහි දැක්වෙන සිතුවම් අතර ගෝනෙකු (*Rusa unicolor*) හෝ මුවෙකු (*Axis axis*) නිරූපණය වන බව නිසැකය. කිඹුලෙකු (*Crocodylus* ) හෝ කබරගොයෙකු (*Iguana iguana*) වස්තු විෂය වන සිතුවමක්ද මෙහි අන්තර්ගතය. යටත් පිරිසෙන් මෙම සතුන් සියල්ලම පාහේ නූතනයේ මෙරට දක්නට ලැබෙන සත්ව විශේෂයන් වේ. වර්තමානයේ වර්ණ තවරා ශිලා පෘෂ්ඨය මත ස්පර්ශ කිරීමෙන් සළකුණු කරන ලද අත්ල රූප 12 ක් පමණ හඳුනාගත හැකිය. යම් යම් ඇතැඟිලි සළකුණු මැනවින් ස්පර්ශ නොවුණු අවස්ථාවන් ද අල්ල පමණක් සළකුණු වූ අවස්ථාද දක්නට ලැබේ. ඇතැම් අත් රූපයන් වඩා දිගැටි බවක් ගන්නා අතර වර්ණයෙන් යුත් දෑත් එක් ස්ථානයක තබා කෙටි දුරක් පසු පසට ඇදීමෙන් එකී හැඩය ලැබී ඇත. මූලික නිරීක්ෂණ අනුව යටත් පිරිසෙයින් පුද්ගලයන් දෙදෙනෙකුවත් අත් සළකුණු තබා ඇත. දකුණත හා වමත යන දෙඅත් රූ දක්නට ලැබුණද වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ වමත භාවිතයෙන් සෑදි අත් සළකුණු වීම විශේෂත්වක් ලෙස සැළකිමට හැකිය. අත් සටහන්වල චතුරස්‍රකාර හැඩය අනුව ඒවා පුරුෂයන්ට අයත් බව උපකල්පනය කළ හැකිය. මෙම සිතුවම් මතුපිට ජ්‍යාමිතික රේඛා මෙන්ම එබඳු රේඛා එක් කර අඳින ලද හඳුනාගත් ජ්‍යාමිතික හැඩතල දක්නට ලැබේ. එම රේඛා කුරුලු රූප හා වෙනත් රූප මත ව්‍යාප්තව තිබේ. එම රූප තිරස්, සිරස්, ඍජු, වක්‍ර රේඛා, තිත් සළකුණු, කඩ ඉරිවලින් සකස් වී ඇත. සිග් සැග් ක්‍රමයට අඳින ලද රේඛාවන්ද මෙහි දක්නට ලැබේ. යථෝක්ථ සිතුවම් වපසරිය මත උක්ත සිතුවම් වර්ගීකරණය මැනවින් දැකීමට හැකිය.

ප්‍රමුඛ පදඃ කුරුල්ලන්ගල, පර්වත ශිඛරය,රක්බිත්තා කන්ද රජ මහා විහාර, ප්‍රිමිටාවකු, ජ්‍යාමිතික රේඛා

[1] පුරාවිද්‍යා අධ්‍යන අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය
gampolavijayathero@gmail.com